Commonwealth OMBUDSMAN

# Commonwealth Ombudsman

Commonwealth Ombudsman හෙවත් මධ්‍යම රජයේ ඔම්බුඩ්ස්මන් යනු ඔස්ට්‍රේලියානු රජයේ දෙපාර්තමේන්තුවලට එරෙහි පැමිණිලි විමර්ශනය කරන ස්වාධීන පුද්ගලයෙකි.

## ඔම්බුඩ්ස්මන් කාර්යභාරය

සෙන්ටර්ලින්ක් (Centrelink), බදු කාර්යාලය (Tax Office), ළමා ආධාරක ආයතන (Child Support Agency), ආගමන දෙපාර්තමේන්තුව (Immigration Department) සහ ඔස්ට්‍රේලියා පෝස්ට් (Australia Post) ඇතුළු ඔස්ට්‍රේලියානු රාජ්‍ය ආයතන බොහෝ ගණනකට අදාල පැමිණිලි ඔම්බුඩ්ස්මන් විසින් විමර්ශනය කල හැක.

ගනු ලැබූ යම් ක්‍රියාවක් හෝ තීරණයක් දෝෂ සහගතද, අත්තනෝමතිකද, අසාධාරණද එසේත් නොමැතිනම් වෙනසකට ලක්කරන සුළුද යන්න තීරණය කිරීම ඔම්බුඩ්ස්මන් විසින් කල යුතුය. තවද පරිපාලනමය ක්‍රියාවන් තුල ඇති ප්‍රමාදයන් හෝ ඌනාවයන් විමර්ශනය කිරීම සම්බන්ධ වගකීමද ඔහු සතුව ඇත.

අනෙක් අතට පුද්ගලයන් හෝ සමාගම්, අධිකරණ විනිශ්චයන්, ප්‍රාන්ත රජයන් හෝ පළාත් පාලන ආයතන, රජයේ ඇමතිවරු හෝ ඇතැම් රජයේ ව්‍යාපාර සම්බන්ධයෙන්වූ පැමිණිලි ඔම්බුඩ්ස්මන් විසින් විමර්ශනය කල නොහැක.

ඔම්බුඩ්ස්මන් අපක්ෂපාතී වන අතර සාධාරණ ප්‍රතිඵල ලබාදීමට කැපවී සිටී.

ඔම්බුඩ්ස්මන් විසින් රාජ්‍ය පරිපාලනය තුල ගැටළු නැවත ඇතිවීම වැලැක්වීම මගින් රාජ්‍ය පරිපාලනය වර්ධනය කිරීමට කටයුතු කෙරේ.

## ඔම්බුඩ්ස්මන් බලතල

රජයේ නිලධාරීන් විසින් ලිපි ලේඛණ භාරදිය යුතු බවට නියම කිරීමට හෝ ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු බවට නියම කිරීමටත් ඇතුළුව පැමිණිල විමර්ශනය කිරීම සම්බන්ධයෙන් ඔම්බුඩ්ස්මන් සතුව පුළුල් බලතල ඇත.

පරිපාලනයේ දෝෂයක් ඇති බවට සොයා ගනු ලබන අවස්ථාවක, අදාල වගකිව යුතු ආයතනය විසින් එය නිවැරදි කර ගත යුතු බවට හෝ ප්‍රතිකර්මයක් ලබාදිය යුතු බවට ඔම්බුඩ්ස්මන් විසින් නිර්දේශ කල හැක.

තවද, අදාල ආයතනය විසින් පැහැදිලි කිරීමක් හෝ සමාව ගැනීමක්, යම් තීරණයක් අදාල කර ගැනීමක් හෝ වෙනස් කිරීමක්, ණයක් කපා හැරීමක් හෝ වන්දියක් ලබා දීමක් වැනි ක්‍රියා මාර්ගයක් ගැනීම ඔම්බුඩ්ස්මන් විසින් නිර්දේශ කල හැක.